# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1768/24 - 2012 ජූලි මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2012.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්ඒ/1923.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට, තලවකැලේ ජල සම්පාදන ක්‍රමයේ නව පොම්පාගාරයට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2012 ජූලි මස 20 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/974.

උපලේඛනය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 475/5, හොලිරූඩ් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, රත්නිල්ලකැලේ කොටස ගමේ පිහිටි හොලිරූඩ් වත්ත, රත්නිල්ලකැලේ කොටස නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඒ. ආර්. එම්. එම්. විජේකෝන් මහතා විසින් මැන සකස් කරන ලද අංක 2597/Ac දරන පිඹුරේ කැබලි අංක 01න් කොටසක් ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් රූ. 01, පර්. 10ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

1A - G 016364— 345 (2012/07)

| | | |
|---|---|---|
| *උතුරට* | : | හොලිරුඩ් වත්ත සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ගබඩා ජලාශය ඉදිකර ඇති ඉඩම ; |
| *නැගෙනහිරට* | : | හොලිරුඩ් වත්ත ; |
| *දකුණට* | : | හොලිරුඩ් වත්ත සහ වතු පාර ; |
| *බටහිරට* | : | හොලිරුඩ් වත්ත සහ වතු පාර. (මෙම සැලැස්මේ කැබලි අංක 01 හා 02) |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. තලවකැලේ තේ වතු සමාගම,
අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10.

08-356

---

එල්ජී/1704.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට, වැලිගම ජල සම්පාදන ක්‍රමයේ ජල තටාකයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2012 ජූලි මස 20 වැනි දින,
අංක 35, "ලක්දිය මැඳුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/975.

*උපලේඛනය*

මාතර දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 377/A පලල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගල්කඩුවහේන ගමේ පිහිටි පැලවත්තහේන නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 80ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | නිවාස වලට යන පාර ; |
| *දකුණට* | : | ප්‍රධාන පාරේ සිට නිවාස වලට යන පාර ; |
| *බටහිරට* | : | බොරලහේන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. රන්දොඹගේ පද්මිණී මිය,
ගල්කඩුව හේන,
පලල්ල,
වැලිගම.

08-357

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.